**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම-2025**
# භූගෝල විද්‍යාව

මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය

| විභාග අංකය / නම : ........................................................................................................ | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය | | කාලය පැය 02 |

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

---

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සූර්යයා ........................................... හා ශක්තිය නිකුත් කරන තාරකාවකි.
   I. ගිනිදැල් II. ආලෝකය III. කිරණ IV. ශබ්ද

02. සෞරග්‍රහ මණ්ඩලය මීට වර්ෂ ..............................කට පෙර නිර්මාණය වන්නට ඇතැයි විශ්වාස කෙරේ.
   I. 4600 II. මිලියන 4600 III. මිලියන 6400 IV. බිලියන 4600

03. පෘථිවිය තම අක්ෂය වටා එක් වරක් භ්‍රමනය වීමේ දී පැය 24ක් තුළ ........................ ක් ගමන් කරයි.
   I. දින 365 II. දින 24 III. $180^{O}$ IV. $360^{O}$

04. පෘථිවිය උතුරු අර්ධ ගෝලය සහ දකුණු අර්ධ ගෝලය ලෙස දෙකට බෙදා වෙන් කරන කල්පිත වෘත්තය ...................... ලෙස හැඳින්වේ.
   I. සමකය II. දේශාංශ III. අක්ෂාංශ IV. කර්කටක නිවර්තනය

05. භූමිය මත ඇති විවිධ ලක්ෂණ වර්ණ, අක්ෂර, සංකේත මගින් ඉදිරිපත් කරන්නේ ............................... ය.
   I. පින්තූර II. පුවත්පත් III. සිතියම් IV. ඡායාරූප

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

06. සෞරග්‍රහ මණ්ඩලයේ අධිකතම උෂ්ණත්වයකින් යුතු ග්‍රහලෝකය බුධ ය. (...........)

07. එරිස් උප ග්‍රහයෙකි. (...........)

08. විශ්වය නිරීක්ෂණය සඳහා දුරදක්නය මුලින්ම භාවිත කරන ලද්දේ ගැලීලියෝ ගැලිලි විසිනි. (...........)

09. දවස ආරම්භ කරන වේලාව මධ්‍යම රාත්‍රී 12.00 ලෙස සැලකේ. (...........)

10. වායුගෝලයේ වැඩිම ප්‍රතිශතයක් ඇත්තේ ඔක්සිජන් වායුවයි. (...........)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

( සූර්ය විෂුවය, $60^0$ , අඟහරු, බ්‍රහස්පති, පරිභ්‍රමණය, $23.5^0$, කක්ෂය)

11. සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහලෝකය වන්නේ................................ ය
12. ෆොබොස් සහ ඩයිමොස් යන උපග්‍රහයින් පිහිටා ඇත්තේ ........................... ග්‍රහයාට ය.
13. පෘථිවිය සූර්යයා වටා ගමන් කරන මාර්ගය .............................. නම් වේ.
14. මාර්තු 21 දින සමකයට හිරු මුදුන් වීම ................................ ලෙස හඳුන්වයි.
15. පෘථිවියේ ආනතිය ......................... කි

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් "අ" තීරුව සමඟ "ආ" තීරුව නිවැරදිව ගළපා යා කරන්න.**

| "අ" | | "අ" |
|---|---|---|
| 16. | සෙනසුරු | A. වාමන ග්‍රහයෙකි |
| 17. | ජලය | B. ඔක්සිජන් |
| 18. | සිකුරු ග්‍රහලෝකය | C. උතුරු අක්ෂාංශ |
| 19. | කර්කටක නිවර්තනය | D. වායුමය ග්‍රහලෝකය |
| 20. | හෝමියා | E. පහන් තරුව |
| | | F. විදුලිබල උත්පාදනය |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- <u>පළමු ප්‍රශ්නය</u> අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව <u>**05කි.**</u>

**01.**

I. පහත දැක්වෙන වරහන් තුළ භූමිය මත දැකිය හැකි ලක්ෂණ කීපයක් දක්වා ඇත. දී ඇති වගුවේ එම ලක්ෂණ වෙන්කොට ලියා දක්වන්න.
(ගංගා, නිවාස, කඳුවැටි, වැව, මහාමාර්ග, වනාන්තර)

| ස්වභාවික ලක්ෂණ | මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණ |
|---|---|
| 1......................................... | 1.......................................... |
| 2......................................... | 2.......................................... |
| 3........................................ | 3.......................................... |

(ල.1 x 6 = 06)

II. ශ්‍රී ලංකාවේ 1:50000 හූ ලක්ෂණ සිතියම් නිර්මාණය කරන ආයතනය කුමක් ද? (ල. 02)

III. ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයම ආවරණය කිරීම සඳහා 1:50000 හූ ලක්ෂණ සිතියම් පත්‍ර කොපමණ ප්‍රමාණයක් නිර්මාණය කර ඇත් ද? (ල. 02)

IV. පහත දැක්වෙන 1:50000 හූ ලක්ෂණ සිතියම් පත්‍ර දැක්වෙන රූපය 01 භාවිත කරමින් ඔබේ පාසල පිහිටි සිතියම් පත්‍රයේ නම සහ අංකය සඳහන් කරන්න.
(ල. 02)

V. පහත දක්වා ඇති ශ්‍රී ලංකාවේ 1:50000 හූලක්ෂණ සිතියම්වල භාවිත වන සම්මත සලකුණු නියමිත වර්ණ හා සංකේත භාවිත කරමින් ඇඳ දක්වන්න.

a. දිස්ත්‍රික් මායිම
b. පාසල
c. ප්‍රධාන මාර්ගය
d. වී වගාව

(ල. 1 X 4 =04 )




රූපය 01

**02.**

I. සෞරග්‍රහ මණ්ඩලය නිර්මාණය වූයේ කෙසේ ද? (ල. 01)

II. සෞරග්‍රහ මණ්ඩලයට අයත් අභ්‍යවකාශ වස්තූන් 02ක් නම් කරන්න. (ල. 02)

III. පහත දැක්වෙන කරුණු හොඳින් කියවන්න.

- සූර්යයාගේ සිට දුර අනුව හයවන ස්ථානයේ පිහිටා ඇත.
- දෙවන විශාලතම ග්‍රහලෝකය වේ.
- දර්ශනීය වළලු පද්ධතියක් පිහිටා ඇත.

ඉහත ලක්ෂණ සහිත ග්‍රහලෝකය අභ්‍යන්තර ග්‍රහ ලෝකයක් ද? බාහිර ග්‍රහ ලෝකයක් ද?

(ල. 02)

IV. තරුවක් ග්‍රහලෝකයකින් වෙනස් වන්නේ කෙසේ ද? වෙනස්කම් 02ක් ලියන්න. (ල. 02)

V. සූර්යයා සෞරග්‍රහ මණ්ඩලයේ පැවැත්මට වැදගත් ය. ඒ බව සනාථ කිරීමට හේතු 02ක් ලියන්න.
(ල. 04)

**03.**

I. වේලාවේ ප්‍රාදේශීය වෙනස්කම් ඇතිවන්නේ කුමන සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ද? (ල. 02)

II. පෘථිවියට දේශාංශ $2^0$ ගමන් කිරීම සඳහා ගතවන කාලය කොපමණ ද? (ල. 02)

III. දේශාංශ $180^0$ රේඛාව (ජාත්‍යන්තර දින රේඛාව) ඍජු රේඛාවක් වූවා නම් සිදුවිය හැකි ප්‍රතිඵලයක් සඳහන් කරන්න. (ල.02)

IV.




රූපය 02

ඉහත රූපය 02 හි පෙන්වන සිදුවීම කුමක් ද? (ල. 02)

V. ඉහත ඔබ සඳහන් කළ සිදුවීම නිසා,

a. මිනිසුන්ට
b. ශාකවලට
c. සතුන්ට

සිදුවන බලපෑම් 01 බැගින් ලියන්න. (ල. 03)

**04.**

I. අක්ෂාංශ හා දේශාංශ වැදගත් වන්නේ ඇයි? (ල. 02)

II. පෘථිවිය දේශාංශ පදනම් කරගත් සම්මත වේලා කලාප කීයකට බෙදා තිබේ ද? (ල. 02)

III. ලෝකයේ සම්මත වේලා කලාප කිහිපයක් භාවිත කරන රටවල් 02ක් නම් කරන්න. (ල. 02)

IV. a . සමක රේඛාවට ($0^0$) උතුරින් ඇති රටක් නම් කරන්න.

b . ඇමෙරිකා එක්සත් ජනපදය පිහිටියේ ග්‍රිනිච් මධ්‍ය රේඛාවට නැගෙනහිරින් ද? බටහිරින් ද? (ල. 02)

V. ශ්‍රී ලංකාව නැගෙනහිර දේශාංශ $75^0$ කලාපයේ පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ දැන් වේලාව මධ්‍යාහ්න 12.00 වේ. ශ්‍රී ලංකාවේ සිට නැගෙනහිර දේශාංශ $105^0$ දක්වන කලාපයේ දැන් වේලාව කීය ද? (ල. 03)

**05.**

I. සූර්යයාගේ සිට පෘථිවියට ඇති දුර කොපමණ ද? (ල. 02)

II. පහත දක්වා ඇති සුවිශේෂී කරුණු සලකා බලා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- හිම හා අයිස් ක්‍රමයෙන් දිය වී යයි.
- කොළ හැලී තිබූ ශාක නැවත දළුලා වැඩී මල් හට ගනී.

a. ඉහත ලක්ෂණ සහිත සෘතුව කුමක් ද? (ල. 02)

III. වසරේ අධිකතම උෂ්ණත්වය සහ දිගම රාත්‍රී කාලය සහිත සෘතු දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

IV. සමකයට හිරු මුදුන් වන විෂුවයන් 02 ක නම් කරන්න. (ල. 02)

V. පෘථිවිය මත ජීවය පැවතීමට බලපා ඇති සාධක 03 ක් සඳහන් කරන්න. (ල. 03)

**06.**

I. වායුගෝලයේ පවතින වායු වර්ග වලට අමතරව ඇති වෙනත් දේවල් 02 ක් නම් කරන්න. (ල. 02)

II. පෘථිවියට වායුගෝලයක් පිහිටා ඇත. එමගින් ඇතිවන වාසි 03 ක් ලියා දක්වන්න. (ල. 03)

III. වායුගෝලය දූෂණය වීමට බලපාන පාරිසරික සිදුවීම් 01ක් සහ මානුෂ ක්‍රියාකාරකම් 02 ක් සඳහන් කරන්න. (ල. 03)

IV. වායු දූෂණය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 02ක් ලියා දක්වන්න. (ල. 02)

V. වායු දූෂණය නිසා ඇතිවන ලෙඩ රෝග 01 ක් සඳහන් කරන්න. (ල. 01)

**07.**

I. පෘථිවියේ පවතින මිරිදිය ජල පරිමාව කොපමණ ද? (ල. 02)

II. ජලය, ගොඩබිම සහ වායුගෝලය අතර චක්‍රීයව සංසරණය වේ. එම ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද? (ල. 03)

III. ජලය ජීවීන්ට වැදගත් වන ආකාර 02ක් සහ ශාක වලට වැදගත් වන ආකාර 01ක් සඳහන් කරන්න. (ල. 03)

IV. ජලය දූෂණය වීමට බලපාන කරුණු 02ක් ලියා දක්වන්න. (ල. 02)

V. අනාගතයේ යම් දිනෙක ජලය නිසා මිනිසුන් අතර ඇතිවන හැකි ගැටලුවක් ලියා දක්වන්න. (ල. 01)